Biodiversity corner

# දිවිකදුරු ශාකය

## Pagiantha dichotoma (Roxb.) Markgraft



Apocynaceae කුලයට අයත් දිවිකදුරු ශාකය ද්විතියික වනාන්තර, කුඹුරු ආදී පහතර
තෙත් පරිසර පද්ධති වල සුලබව හමුවන දේශීය ශාකයකි. උසින් මීටර අටක් පමණ වේ. ක
පත්‍ර හා පුෂ්ප වෘන්ත වලින් සුදු පැහැති විෂ සහිත ශ්‍රාවයක් නිකුත් කරයි. දිලිසෙනසුලු පද
තලයකි. පත්‍රය ඉලිප්සාකාර හැඩයෙන් යුක්ත අතර පත්‍ර පාදය පටුය. මේරූ ශාක පත්‍ර ත
කොළ පැහැති වන අතර පරිනතවත්ම කහ පැහැයට හැරේ. පත්‍ර නාරටි වඩා පැහැදිලි
හඳුනාගතහැකි අතර නාරටි මැද නාරටිය සමග සාපුකෝණීයව හමුවේ. සුදු පැහැති පුෂ්
පොකුරු ලෙස හමුවේ. පුෂ්ප ගෙල හා මුකුට නාලය ලා කහ පැහැතිය. යුගල වශයෙන් හෙ
තනි තනිව පිහිටන පලය තරමක් පැත්තකට නම්පවූ අණ්ඩාකාර හැඩතිය. කොළ පැහැ
ඵලය පරිණතවත්ම තැඹිලි පැහැයට හැරේ.

ඵලය තුල ඇති රතු පැහැති පල්පය තුල ගිලී දුඹුරු පැහැති බීජ කිහිපයක් දැකගත හැකිය. ශාක පත්‍ර වල හැඩය හා බීජ වල හැඩය එක්ව ගත්කල දිවිකදුරු ශාකය පහසුවෙන් හඳුනාගත හැක. ඖෂධ සඳහා අවශ්‍ය ශාක කොටස් ලබාගැනීමටත් වෙස්මුහුණු කැපීමට දැව ලබාගැනීමටත් මෙම ශාකය භාවිත වේ. දියසරු උද්‍යානයේ ප්‍රවේශ පත්‍ර කවුළුවට පිටුපසින් ඇති වසර පුරා මලින් හා ඵලින් බරවන දිවිකදුරු ගස උද්‍යානයට අලංකාරයක් එක්කරන අතර ලොකු කුඩා ශාක පර්යේෂකයන්ගේ අධ්‍යයනයට නතුවන ශාකයකි. මෙම ශාකය නාගරික තෙත්බිම් පරිසර පද්ධති වලට උචිත ශාකයක් වන අතර දැනට දිවිකදුරු ශාක දහයක් පමණ දියසරු උද්‍යානය තුල අන්තර්ගතය.

# දියසරු උද්‍යානයට පැමිණි ආගන්තුක මායන් සික්ලිඩ්

# Mayan Cichlid (*Mayaheros urophthalmus*)

## කඩිනම් අවධානයට ලක්විය යුතු ආගන්තුකයෙක්......

දියවන්නා ඔයට යාබදව පිහිටි දියසරු උද්‍යානය දියවන්නා ඔය පරිසර පද්ධතියේම කොටසක් වේ. එසේම, දියසරු උද්‍යානයේ කුඩා පොකුණු හැර එහි තිබෙන විශාල පොකුණු සහ ජල මාර්ග සියල්ලම දියවන්නා ඔයේ ජල මාර්ග පද්ධතියේම කොටසක් ලෙස පවතී. මේ නිසා වියළි කාලයේදී හිඳීයාමේ අවදානම මගහැරී යාම වැනි වාසිදායක තත්වයක් උදාවී තිබුනද, ලවණතාවයට ලක්වීම සහ දියවන්නා ඔය පරිසර පද්ධතියේ සිටින ආක්‍රමණික සත්ව විශේෂ සහ ආක්‍රමණික ජලජ ශාක විශේෂ වලටත් ඉතා කඩිනමින් සහ පහසුවෙන්ම දියසරු උයනේ ජලජ පරිසරය ආක්‍රමණයට ඉඩකඩ සැලසී තිබීම මෙහි තිබෙන ප්‍රධානතම අවාසිදායක තත්ත්වයන් වේ.

දියවන්නා ඔය පරිසර පද්ධතිය තුල මේ වන විටත් විදේශීය මත්ස්‍ය විශේෂ ගණනාවක් බෝවෙමින් තිබෙන බව පෙනෙන්නට තිබේ. මොවුන් අතුරින් සැලකිය යුතු ප්‍රතිශතයක් කොරලි අයත් වන සික්ලිඩේ කුලයේ වන අතර මින් ඇතැම් විශේෂ ශ්‍රී ලංකාවේ ජල මාර්ග වල හමුවන එකම ප්‍රදේශය වන්නේත් දියවන්නා ඔය පද්ධතිය වේ. එසේම මින් බොහෝ දෙනෙකු මේ වන විටත් දියවන්නා ඔය පරිසර පද්ධතිය තුල බෝවෙමින් සහ ව්‍යාප්ත වෙමින් පවතින නිසා මොවුන් මේ වන විටත් දියසරු උද්‍යානයේ  ජල මාර්ගවලට පැමිණ තිබේද, එහි දැනටමත් බෝවන බවට වාර්තා වන්නේද සහ එනිසා එම පරිසර පද්ධතියේ සිටින දේශීය මත්ස්‍යයන්ට, අනෙකුත් ජලජ සතුන්ට මෙන්ම, ජීවන චක්‍රයේ අවධියක් ජලයේ ගතකරන ඕඩොනේටාවන් හෙවත් බත්කූරන් සහ ඉරටුකූරන් කෙරෙහි කෙසේ බලපාන්නේද යන්නත් අවධානයට ලක්කල යුතු කරුණු අතර වේ.

දියසරු උද්‍යානය පිහිටුවීමෙන් පසුව එතුලට පැමිණි ආගන්තුක මත්ස්‍යයන් අතුරින් ප්‍රධානම තැනකට පත්ව තිබෙන්නේ මායන් සික්ලිඩ් මත්ස්‍යයා වේ. 2015 දී වාර්තාගත නොවූ මේ විශේෂය ප්‍රථම වරට නිරීක්ෂණය වූයේ 2017දී පමණය. නමුත් 2019 වසර අවසානය වනවිට මායන් සික්ලිඩ් මත්ස්‍යයා දියසරු උද්‍යානයේ සියලු විශාල පොකුණු සහ ජල මාර්ග පද්ධතියේත් ප්‍රමුඛතම මත්ස්‍යයෙකු බවට පත්වී තිබේ. එසේම මේ මත්ස්‍යයාගේ ප්‍රජනනයත් 2018 සිටම දියසරු උද්‍යානයේදී දැකිය හැකිවිය. මේ නිසාම දියසරු උද්‍යානයේ ආගන්තුක මසුන් අධ්‍යයනයේ දී මායන් සික්ලිඩ් කෙරෙහි විශේෂයෙන් අවධානය යොමුකිරීම වැදගත් වනු ඇත.

කොරලි අයත්වන සික්ලිඩේ කුලයේ (family-Cichlidae) සාමාජිකයෙකු වන මේ මත්ස්‍යයාගේ නිජබිම මධ්‍යම ඇමෙරිකාවේ මෙක්සිකෝ (Mexico) සිට නිකරගුවාව (Nicaragua) තෙක් ප්‍රදේශය වේ. අලංකාරයට ඇතිකිරීම සඳහා විසිතුරු මත්ස්‍යයෙකු ලෙස මෙන්ම ආහාරයක් ලෙසත් වෙනත් බොහොමයක් රටවලට ගෙන ගොස් තිබෙන මේ මත්ස්‍යයා ශ්‍රී ලංකාවට ගෙනවිත් තිබෙන්නේ විසිතුරු මත්ස්‍යයෙකු ලෙසටය.

ප්‍රමාණයෙන් සෙ.මී. 40ක් හෙවත් අඟල් 16 පමණ දිගකට වැඩේ. ශරීරය දුඹුරුවන් කළු පාටක සිට කහ-කොළ හෝ කොළවන් වේ. ශරීරයේ පැහැදිලි සිරස් කලු ඉරි හතක් පමණ තිබේ. වලිගයට (පෞච්ඡ වරලට) මදක් ඉදිරියෙන් හෙවත් පෞච්ඡ වෘන්තයේ කහපාට දාරයකින් වට වූ කළු පාට මධ්‍යයක් සහිත සහ ඉතා පැහැදිලිව පෙනෙන ව්‍යාජ ඇස් සලකුණක් (ocellus / false-eye / eye-spot) තිබේ. ශරීර වර්ණය, කලු ඉරි පිහිටීම සහ මේ ව්‍යාජ ඇස් සලකුණ නිසා මේ මත්ස්‍යයා පහසුවෙන් හඳුනාගත හැකි වේ. පරිණත මසුන්ගේ පෘෂ්ඨීය වරලේ සහ පෞච්ඡ වරලේ (වලිගයේ) රතු පාට දාරයක් දකින්නට හැක. පිරිමි සතුන් වර්ණවත් බවින් වැඩිය.










ප්‍රජනනයේ දී නොගැඹුරු ජලයේ පත්ල මත තිබෙන ගලක් වැනි තද පෘෂ්ඨයක් පිරිසිදු කර එය තතු ප්‍රදේශයක් ලෙස තබා ගන්නා පිරිමි සතා විසින් එතැනදී ප්‍රජනන කාර්යය සිදුකිරීමෙන් පසු මේ පෘෂ්ඨයේ බිත්තර ඇලවීම ගැහැනු සතා විසින් සිදු කරයි. ඉන් පසු බිත්තර සහ කුඩා කල පැටවුන් රැකබලා ගැනීම වැඩිහිටි මත්ස්‍ය යුවල විසින්ම සිදු කරයි. මේ නිසා බිත්තර වලින් සාර්ථකවන පැටවුන් සංඛ්‍යාව විශාලය. මෙම චර්යාව නිසා ඔවුනට තම ගහනය හොඳින් වර්ධනය කරගැනීමට හැකියාව ලැබී තිබේ. කලහකාරී චර්යාවන් සහිත වීමත්, ප්‍රධාන වශයෙන් මාංශ භක්ෂක භෝජන රටාවත්, ඉක්මනින් ප්‍රජනනය කිරීමත්, වැඩි පැටවුන් සංඛ්‍යාවක් සාර්ථකව ඉතිරිවීමත්, මිරිදියේ මෙන්ම කිවුල් දියේ වාසය කිරීමේ හැකියාව මෙන්ම තරමක් අපිරිසිදු ජලයේත් සාර්ථකව වර්ධනය වීමේ සහ ප්‍රජනනය කිරීමේත් හැකියාවන් සහිත බව පසුගිය කාලයේ කල නිරීක්ෂණයන් වේ.

මෙම ලක්ෂණ මෙම මත්ස්‍යයාගේ සාර්ථකත්වයට හේතු වනවාට අමතරව එම මත්ස්‍යයා ප්‍රබල ආක්‍රමණික ආගන්තුක විශේෂයක් (Invasive Alien Species) වීමේ අවදානමත් ඉතා හොඳින් පෙන්නුම් කරදෙයි. මේ වන විටත් මෙම මත්ස්‍යය විශේෂය දියවන්නා ඔය පරිසර පද්ධතියේ සියලුම ප්‍රදේශ වලින් වාර්තා වේ. එසේම මොවුන් ප්‍රජනනයේ යෙදීම මුලින්ම දුටු දියසරු උද්‍යානයේ ජල මාර්ගවල මේ වනවිට මොවුන් මෙම කුලයේ දේශීය විශේෂයන් වන රැල්ලියා (Orange Chromide) සහ කොරලියා (Green Chromide) ප්‍රජනනය කිරීමට යොදාගත් ස්ථාන සියල්ල අත්පත් කරගෙන හමාරය. මේ මත්ස්‍යයාගේ ප්‍රචාරණය තව දුරටත් සිදුවීම වළක්වා ගැනීමට කඩිනම් පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ. මේ වනවිටත් සමහර ස්ථානවල මෙම විශේෂය ප්‍රමුඛ විශේෂය වී තිබීම ඊට හේතුව වේ. මෙම මත්ස්‍යයා නිසා එවන් උපස්ථරවල බිත්තර අලවන කොරලියාට සෘජු තර්ජනයක් එල්ලවී තිබෙන බව ප්‍රකට වන මුත්, අන් මත්ස්‍යයන්ට සහ වෙනත් ජලජ සතුන්ට වියහැකි හානිකර තත්වයන් අධ්‍යයනයට ලක්කිරීමත් වැදගත් වේ.



ආචාර්ය ජගත් ගුණවර්ධන
පරිසර විද්‍යාඥ සහ නීතිඥ

Indian pitta
(Pitta brachyura)



This Indian Pitta was captured by
Mr. Bandu Biyanwila
an amateur wildlife photographer

Visit Diyasaru Park during this migratory season to live-spot this bird. Further, browse the "Citizen Science Corner" at the study centre of Diyasaru Park to know more information on Indian pitta & other migrants.

From
Visior's
Eye


ලතුවැකියා
Painted Stork
Mycteria leucocephala (Pennant, 1769)
(Family: Ciconiidae)



ශ්‍රී ලංකාවේ හමුවන මානා කොකුන් විශේෂයක් වන ලතුවැකියා දියසරු තෙත්බිම් උද්‍යානයේ දී පාරිසරික ඡායාරූප ශිල්පී චමල් ජයවීරගේ ගේ කැමරා කාචයේ සටහන් වූ අයුරු.

இந்த Painted Stork (நாரை) தியசரு பூங்காவில், வனவிலங்கு புகைப்படக்கலைஞர் சமல்ஜெயவீர என்பவரால் புகைப்படமாக்கபட்டது.

From
Visior's
Eye



This Dark Palmdart  was captured at Diyasaru Park by
Professor Prasajith Kapila Dissanayake

<u>තදපැහැ පදුරු-සැරියා</u>
<u>Dark Palmdart</u>
<u>(Telicota bambusae lanka)</u>

Belongs to family Hesperiidae. It is one of the endemic sub species in Sri Lanka. Occasionally visits the Diyasaru Park. Larvae feed on Bamboo leaves.

හෙස්පෙරිඩේ පවුලට අයත් ශ්‍රී ලංකාවට ආවේණික උප විශේෂයකි. දියසරු උද්‍යානයේ දී බහුලව දැකගත හැකි අතර පිළා අවධිය උණ ශාකයේ පත්‍ර මත පෝෂණය වේ.

ஹெஸ்பெரிடே குடும்பத்துக்கு சொந்தமான இது இலங்கையின் உள்ளூர் துணை இனங்களில் ஒன்றாகும். இவை இடைக்கிடையே தியசரு பூங்காவிற்கு வருகைதருவதோடு, இவற்றின் குடம்பி பருவத்தில் இவை மூங்கில் இலைகளை உண்ண கூடியதாக காணப்படுகின்றன.

# Scarlet Basker

## Urothemis signata (Rambur, 1842)



A red color, medium-sized dragonfly commonly encountered in open wetlands and surrounding habitats. The Male is almost entirely red with some black markings on the side of the thorax and the abdomen tip. Wings are transparent with dark amber patches on the wing base, especially in the hind wings. These patches are bordered with golden amber in females. The prominent diamond-shaped spots on the dorsal side of abdomen segments 8 and 9 distinguishes the Scarlet Basker male from the males of any other similar red dragonflies found in the country. The Female is yellowish and with broader black markings on the thorax and abdomen. Reddish females somewhat similar to the males are also seen rarely in this species. Abdomen length ranges between 25-28 mm and hind wing length is between 34-37 mm.

Scarlet Basker inhabits marshes, tanks, ponds, paddy fields, slow-flowing canals and other similar habitats. Males often perch on aquatic vegetation in the wetland or in the riparian vegetation. They are generally very aggressive and chases away any other red colour dragonflies flying close to their territory. They breed in marshlands and other stagnant water habitats. Males can be seen guarding egg laying females. Distributed mainly in the low country of Sri Lanka but uncommonly found in lower montane areas as well. Adult Scarlet Basker dragonflies can be seen throughout the year.

Amila P. Sumanapala
Dragonfly specialist
Member, IUCN SSC Dragonfly Specialist Group 2021-2025,
Lead Auditor for the FSC® Forest Management Certification